10 ශ්‍රේණිය

# බුද්ධ ධර්මය

## 13 පාඩම


සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා

කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)

දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com

දු.ක. අංකය :- 0718416477, 0702035765

# 13 පාඩම

# ඇති තතු කියන තිලකුණු දහම

## ත්‍රිලක්ෂණය යනු

1. අනිත්‍ය ලක්ෂණය
2. දුක්ඛ ලක්ෂණය
3. අනාත්ම ලක්ෂණය

- මෙය බුදු දහමේ මූලික ඉගැන්වීමකි.
- ප්‍රඥාව ලෙස හැඳින්වෙන්නේ මෙම ත්‍රිලක්ෂණ අවබෝධය යි.
- ප්‍රඥාව සසර දුකින් එතෙරව නිවන් පසක් කරනු පිණිස උපකාර වේ.
- කාල, දේශ, වශයෙන් වෙනස් නොවන සදාකාලිකව ලොව පවත්නා විශ්ව සාධාරණ ධර්මතාවකි.

# 1. අනිත්‍ය ලක්ෂණය

- අනිත්‍ය යනු වෙනස් වීම යි, කැඩෙන බිf|න සුලු බවයි.
- මෙම කැඩෙන බිf|න සුලු බව බුදු දහමේ **ලෝක** යනුවෙන් හැඳින්වේ.
- බුදු දහමට අනුව හට ගැනිමේ සුවභාවය ඇති සෑම දේ ම නැති වීමේ ස්වභාවයෙන් යුක්තය.
- සත්ත්ව, පුද්ගල, ද්‍රව්‍ය ආදී ජීව අජීව පදාර්ථයකට ම මෙම සදාතනික පොදු ධර්මතාවකි.
- මේ අනුව ලොව සියල්ල මොහොතින් මොහොත වෙනස් වන බවත් කිසිවක ස්ථිරසාර පැවැත්මක් නොමැති බවත් මින් අදහස් වේ.
- බුදු දහම අනුව සත්ත්වයා, ලෝකය යනුවෙන් හැඳින්වෙන්නේ **රූප ධර්ම හා නාම** ධර්මයන් ය.

# පඤ්චස්කන්ධය හා ඒ සඳහා දක්වා ඇති උපමාවන්

**රූප -** I. රූප ස්කන්ධය - පෙණ පිඬක් වැනිය

(ඇස, කන, නාසය, දිව, ශරීරය ආදී භෞතික සැකැස්ම)

**නාම**

ii. වේදනා ස්කන්ධය - දිය බුබුලක් වැනිය

(වින්දනය, විඳීම)

iii. සඤ්ඤා ස්කන්ධය - මිරිඟුවක් වැනිය

(හැඳිනීම)

iv. සංඛාර ස්කන්ධය - කෙසෙල් කඳක් වැනිය

(චේතනා, රැස් කිරීම්)

v. විඤ්ඤාණ ස්කන්ධය - මායාවක් වැනිය

(අරමුණු දැන ගැනීම)

# පඤ්චස්කන්ධයට දක්වා ඇති උපමාවන් ගාථාවක මෙසේ දැක්වේ.

ඵේණපිණ්ඩූපමං රූපං - වෙදනා බුබ්බුලූපමා
මරීචිකූපමා සඤ්ඤා - සංඛාරා කදලූපමා
මායූපමඤ්ච විඤ්ඤාණං - දීපිතාදිච්චබන්ධුනා

චතුරාර්‍ය සත්‍ය - රේරුකානේ චන්දවිමල හිමි

# 2. දුක්ඛ ලක්ෂණය

- සාංසාරික පැවැත්ම මූලික වශයෙන් ම දුක් සහිත ය. සැපදායක යැයි සැලකෙන සියලු වින්දනයන් තාවකාලික ය. අනිත්‍ය ය. එබැවින් දුක් සහිත ය.
- මංගල ධර්මදේශනයේ දී ම බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි

**"ඉදං ඛෝ පන භික්ඛවේ, දුක්ඛං අරිය සච්චං - ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛෝ, මරණම්පි දුක්ඛං, අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ, පියෙහි විප්පයෝගෝ දුක්ඛෝ, යම්පිච්චං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"**

(බු.ජ.ත්‍රි. ධම්මචක්කප්පවත්තන සූත්‍රය)

(ඉපදීම දුකය, ජරාව දුකය, ලෙඩවීම දුකය, මරණය දුකය, අප්‍රියයන් හා එක්වීම දුකය, ප්‍රියයන්ගෙන් වෙන්වීම දුකය, කැමති යමක් නොලැබීම දුකය, සැකවින් පඤ්ච උපාධාන්ස්කන්ධය දුකය)

# 3. අනාත්ම ලක්ෂණය

- ආත්ම යනු සංස්කෘත භාෂාමය වචනයෙහි සිංහල අර්ථය **මම හෙවත් තමා යන්න** යි.
- බුදුරදුන් වැඩ සිටි කාලයෙහි ඇතමුන්ගේ විශ්වාසය වූයේ, සිතුවිලි සිතන්නේ ද වේදනා විඳින්නේ ද හොඳ නරක කරන්නේ ද විපාක විඳින්නේ ද භවයෙන් භවයට නොවෙනස්ව ගමන්කරන එකම පදාර්ථයක් හෙවත් ආත්මයක් බව යි.
- සියලු කෙලෙස් උපදින්නේ ආත්ම දෘෂ්ටිය නිසාය.
- ඉහත දැක් වූ පරිදි සත්ත්වයා, පුද්ගලයා, මම, ආත්ම යනු සම්මුතියකි. වචන මාත්‍රයකි. ඉන් අදහස් වන්නේ ස්කන්ධ, ධාතු, ආයතන, යැයි හැඳින්විය හැකි ශක්ති සමූහයක් පමණි. මෙම ශක්ති සියල්ල  අනිත්‍යය හෙවත් වෙනස් වන සුලු ය. එබැවින් මෙහි ආත්ම වශයෙන් ගත හැකි කිසිවක් නොමැති බව බුදුරදුන් දේශනා කළේය.

# ත්‍රිලක්ෂණය ගැන අවබෝධයෙන් පුද්ගලයාට වන යහපත

- අසීමිත වූ ආසාවන්ගෙන් තොර වේ.
- අඩු බලාපොරොත්තු ඇත්තෙකු (අල්පේච්ඡ) වේ.
- ලද දෙයින් සතුටු වේ.
- පහසුවෙන් පෝෂණය කළ හැකි වේ.
- කාර්ය බහුල නොවේ.
- සිත සැහැල්ලු ය.
- ඉඳුරන් සන්සුන් ය.
- අටලෝ දහමින් නොසැලේ.
- උත්සාහවන්ත ය.
- අන්තගාමී නොවේ.
- අනතිමානී වේ.
- ආචාරශීලීය වේ.

ලොව සියල්ල අනිත්‍ය ය, දුක් සහිත ය, අනාත්ම ය, යන සත්‍යය දැන දැක අවබෝධ කිරීම බුදු දහමේ විපස්සනාව ලෙස දැක්වේ. ඒ තුළින් ප්‍රඥාව අවධි වේ. ප්‍රඥාව නිවන් අවබෝධය සඳහා උපකාරී වේ.

# පුහුණුවට

අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තේසං වූපසමෝ සුඛෝ
(පරිනිබ්බාන සූත්‍රය)

ඇති වී නැති ව යන බැවින් සංස්කාර ඒකාන්ත වශයෙන් ම අනිත්‍ය ය. සංස්කාර ඉපදී නැති වන්නේය. ඒ සංස්කාර වල සංසිඳීම සැපයකි

# තෙරුවන් සරණයි..!